# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2395/65 – 2024 අගෝස්තු මස 03 වැනි සෙනසුරාදා – 2024.08.03**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, හාරිස්පත්තුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කුළුගම්මන සියපත්තුව කෝරළේ සුළු කොට්ඨාසයේ, පොල්වත්ත (420) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පොල්වත්ත ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියලෙ කරන ලද අංක Maha/HRS/2020/259 හා 2021.01.21 දිනැති ප්‍රගමණ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුත් ඉඩම් කැබලි වලට මායිම්:

01. කැබලි අක්ෂර '**A**' – කොටුවගාවහින්න – ප්‍රමාණය: හෙක්. **0.0038**

උතුරට සහ නැගෙනහිරට: ශ්‍රී මහා පත්තිනි දේවාලය හිමිකම් කියන කොටුවගාවහින්න ; දකුණට: ශ්‍රී මහා පත්තිනි දේවාලය හිමිකම් කියන කොටුවගාවහින්න, කැබලි අක්ෂර B සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන කොටුවගාවහින්න; බටහිරට: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන කොටුවගාවහින්න සහ ශ්‍රී මහා පත්තිනි දේවාලය හිමිකම් කියන කොටුවගාවහින්න.

02. කැබලි අක්ෂර '**B**' – කොටුවගාවහින්න – ප්‍රමාණය: හෙක්. **0.0063**

උතුරට: කැබලි අක්ෂර A සහ ශ්‍රී මහා පත්තිනි දේවාලය හිමිකම් කියන කොටුවගාවහින්න; නැගෙනහිරට: ශ්‍රී මහා පත්තිනි දේවාලය හිමිකම් කියන කොටුවගාවහින්න; දකුණට: ශ්‍රී මහා පත්තිනි දේවාලය හිමිකම් කියන කොටුවගාවහින්න සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන කොටුවගාවහින්න; බටහිරට: ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හිමිකම් කියන කොටුවගාවහින්න සහ කැබලි අක්ෂර A.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2019/WS/486.
2024 ජූනි මස 19 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 08-0026

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

## 5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, සංචාරක හා ඉඩම් අමාත්‍ය නාලක ජූඩ් හරින් ප්‍රනාන්දු වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 532බී ගොඩිගමුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගොඩිගමුව (මහරගම නගර සභා සීමාව තුල) ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක CO/MHR/2019/508 හා 2019.11.30 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබැල්ලට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' – සොයාගත නොහැක – ප්‍රමාණය: හෙක්. 0.0101**

උතුරට: මාර්ගය සහ නල්ලවත්ත පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි බාලසූරියගේ මහේෂ් හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: නල්ලවත්ත පාරේ වරිපනම් අංක සොයාගත නොහැකි බාලසූරියගේ මහේෂ් හිමිකම් කියන ඉඩම සහ නල්ලවත්ත පාරේ වරිපනම් අංකය හා හිමිකම් කියන්නා සොයාගත නොහැකි කුඹුරු ඉඩම; දකුණට: නල්ලවත්ත පාරේ වරිපනම් අංකය හා හිමිකම් කියන්නා සොයාගත නොහැකි කුඹුරු ඉඩම; බටහිරට: නල්ලවත්ත පාරේ වරිපනම් අංකය හා හිමිකම් කියන්නා සොයාගත නොහැකි කුඹුරු ඉඩම සහ මාර්ගය.

**හරින් ප්‍රනාන්දු,**
සංචාරක හා ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2018/WS/220.
2024 අප්‍රේල් මස 10 වැනි දින,
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 08-0027

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.